# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1645/45 - 2010 මාර්තු 20 වැනි සෙනසුරාදා - 2010.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය අහමඩ් ලෙබ්බෙ මරික්කාර් අතාඋල්ලා වන මම, එකී මණ්ඩලයට ආසියානු සංවර්ධන බංකු ආධාර 5 ව්‍යාපෘතිය යටතේ හලාවත ජල සම්පාදන ක්‍රමයේ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

අහමඩ් ලෙබ්බෙ මරික්කාර් අතාඋල්ලා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

5/2/2/867
2009 ඔක්තෝබර් මස 05 වැනි දින,
අංක 34, නාරාහේන්පිට පාර, නාවල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 1478 විලත්තව පළාත, බිංගිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, විහාරගම ගමේ පිහිටි විහාරගම නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ජී. අබේගුණවර්ධන යන අය විසින් පිළියෙල කරන ලද අංක 2008/ඩබ්1 දරන සැලසුමේ කැබලි අංක 1 හි සඳහන් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.0239 (අක්කර 5) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ;

*උතුරට* : අංක 1445 අවසාන ගම් පිඹුරු සිතියමේ කැබලි අංක 02 හි ඉතිරි කොටස ;
*නැගෙනහිරට* : අංක 1445 අවසාන ගම් පිඹුරු සිතියමේ කැබලි අංක 02 හි ඉතිරි කොටස ;
*දකුණට* : බිංගිරිය කොළමුනඔය අමුණ සිට විලත්තව දක්වා ඇති යෝධ ඇලට සම්බන්ධ ප්‍රවේශ මාර්ගය (අ.ග.පි. 1445 කැබලි අංක 11) ;
*බටහිරට* : අංක 1445 දරන අවසාන ගම් පිඹුරු සිතියමේ කැබලි 02හි ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01 මහා භාරකාර,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
බුලර්ස් පාර, කොළඹ 07.

02. විහාරාධිපති,
පූජ්‍ය මලගනේ අත්තදස්සී ස්ථවිර,
බිංගිරිය රජමහා විහාරය, බිංගිරිය.

04 -189

1A - G 12644— 350 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.